# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත) තෙවන වසර - 2021

## අන්තර්ජාතික ආයෝජන නීතිය

(පැය තුනකි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: (06)

**<u>එක් කොටසකින්</u> අවම වශයෙන් එක් ප්‍රශ්නයක් (01) තෝරාගෙන ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

**(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)**

---

### අ කොටස

බොලෝනියාව, ලිමුරියා මහාද්වීපයේ පිහිටි සම්පත්වලින් පොහොසත් සංවර්ධනය වෙමින් පවතින රටකි. රටේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට, විශේෂ පතල් දිස්ත්‍රික්කයක් නිර්මාණය කරමින් (වෙලෝනා) සහ ලොව පුරා සිටින පතල් ආයෝජකයන්ට බොලිනියාවේ නැගී එන පතල් අංශයේ ආයෝජනය කරන ලෙස ආරාධනා කරමින්, බොලොනියා ආණ්ඩුව විදේශ පතල් ආයෝජන ආකර්ෂණය කර ගැනීමට තීරණය කළේය. මෙම යෝජනාවෙන් උනන්දුවට පත්, සෙලොනියානු නීතිය යටතේ ස්ථාපනය කරන ලද සමාගමක් වන මින්ටෙක්ස් රිසෝසස් ලිමිටඩ් (මින්ටෙක්ස්), වෙලෝනා පතල් දිස්ත්‍රික්කයේ පිහිටි ලීමා රත්රන් නිධියේ (ලීමා ව්‍යාපෘතිය) ආයෝජනය කිරීමට තීරණය කළේය. ලීමා රත්රන් නිධිය තුළ හෙක්ටයාර 300 ක ප්‍රදේශයක ඇති වටිනා ලෝහ ගවේෂණයට (explore) සහ භාවිතයට (exploit) දරන්නාට හිමිකම් ලබා දෙන අවසර පත්‍රයක් (permit) ඇති ස්මිත් මහතා සමග 2010 දී මින්ටෙක්ස් පැවරුම් ගිවිසුමකට ඇතුළත් විය. 2011 දී, මින්ටෙක්ස් මතුපිට සිතියම්කරණය, නියැදීම, සහ කැණීම් වැඩ සටහන් ආරම්භ කළ අතර බලපත්‍රය සඳහා වන පතල් ව්‍යාපෘතියේ ගවේෂණාත්මක අදියර සඳහා අවශ්‍ය වන පාරිසරක අනුමැතිය ද ලබා ගත්තේය.

2012 දී, මින්ටෙක්ස්, ලීමා රත්රන් නිධිය ගවේෂණයට සහ භාවිත කිරීමට බොලිනියාවේ ජාතික පතල් ඒජන්සිය (NMA) සමග සහන ගිවිසුමකට (Concession Contract) ඇතුලත් වූ අතර පතල් ව්‍යාපෘතියේ 100% සමාගමට හිමිවිය. අදාළ බොලෝනියානු නීති යටතේ, භාවිත කිරීමේ අදියර වෙත යාමට පෙර මින්ටෙක්ස් විසින් පාරිසරික බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය විය. ඒ අනුව, මෙම බලපත්‍රය ලබා ගැනීම සඳහා මින්ටෙක්ස් පරිසර හා තිරසාර සංවර්ධන අමාත්‍යාංශය වෙත පාරිසරික බලපෑම් අධ්‍යයනය (EIS) ඉදිරිපත් කළේය. කෙසේවෙතත්, අමාත්‍යවරයා පාරිසරික බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කරමින් කියා

සිටියේ, ලීමා ව්‍යාපෘතිය පැරමෝ (páramo) ලෙස හඳුන්වන අද්විතීය පරිසර පද්ධතියක පවතින බවයි; මෙම විශේෂිත අවස්ථාවෙහිදී එය වීනස් (Venus) නමින් හඳුන්වන පැරමෝ පරිසර පද්ධතියයි. අමාත්‍යාංශයට අනුයුක්ත පර්යේෂණ ඒකකය විසින් 2013 දී සකස් කරන ලද බොලෝනියාවේ පැරමෝ පරිසර පද්ධති හඳුනා ගැනීමට අවශ්‍යය වන සිතියමක් මත පදනම්ව මෙම තීරණය ගනු ලැබීය. බොලෝනියාවේ සංශෝධිත පතල් නීතියට අනුව, ඉතා සුළු ව්‍යතිරේක වලට යටත්ව, පැරමෝ පරිසර පද්ධති ඇතුළුව ප්‍රකාශිත සහ සීමා කළ ප්‍රදේශවල පතල් ගවේෂණ හා භාවිත කිරීම සහ ව්‍යාපෘති සිදු කිරීමට අවසර නොමැති බව එහි වැඩි දුරටත් සඳහන් විය.

මේ අතර, නීත්‍යානුකූලව පැරමෝ පරිසර පද්ධති සීමා නිර්ණය කිරීම (delimiting) බොලෝනියාවේ දැඩි මතභේදයට තුඩු දුන් අතර, බොහෝ සිවිල් සමාජ සංවිධාන (CSOs), වීනස් පැරමෝව මත ඇති විය හැකි පාරිසරික බලපෑම නිසා ලීමා ව්‍යාපෘතියට විරුද්ධ වූහ. පරිසර අමාත්‍යවරයා පාරිසරික බලපත්‍රය ලබාදීම ප්‍රතික්ෂේප කළද, NMA, සහන ගිවිසුම යටතේ ගවේෂණ අදියර පළමුව වසරකට දීර්ඝ කිරීම සඳහා වූ මින්ටෙක්ස්ගේ අයදුම්පත අනුමත කර, එහි ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත් කළේය. කෙසේවෙතත්, බොලෝනියාවේදී මින්ටෙක්ස් සමාගම මුහුණ දුන් අනපේක්ෂිත තත්ත්වයන් මධ්‍යයේ, සමාගම එහි කොටස් වලින් 49 % ක් සලමන් දූපතේ සංස්ථාපිත සමාගමකට විකුණූ අතර සහන ගිවිසුම යටතේ ගවේෂණ අදියර දෙවනුවත් වසරක් දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටියේය.

දෙවන දීර්ඝ කිරීම ලබා දෙමින්, NMA ප්‍රකාශ කළේ එම දීර්ඝ කීරීම වීනස් පැරමෝව සමඟ අතිච්ඡාදනය (overlap) නොවන ප්‍රදේශය සඳහා පමණක් බවත් සහ මින්ටෙක්ස් වෙත වැඩිදුරටත් දන්වා සිටියේ, සීමා නිර්ණය කිරීම අවසන් වූ පසු වීනස් පැරමෝව සමඟ අතිච්ඡාදනය වන ප්‍රදේශ භාර දිය යුතු බවත්ය. 2017 දී, යෝජනා සම්මතයක් මගින් රටේ පැරමෝ මායිම් ප්‍රකාශයට පත් කළ අතර, කැණීම් සහන ගිවිසුමක් සහ පාරිසරික බලපත්‍රයක් සහිත ව්‍යාපෘති පැරමෝවක පිහිටා තිබියද, එම සහන ගිවිසුම් කල් ඉකුත් වන තෙක් පමණක්, මෙහෙයුම් දිගටම කරගෙන යාමට ඉඩ ලබා දුණි. කෙසේවෙතත්, සීමා නිර්ණය කිරීමේ ක්‍රියාවලියේදී මහජන අදහස් විමසීමක් සිදු නොවීම පිළිබඳව චෝදනා කරමින් CSOs විසින් මෙම යෝජනාව රටේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලදී. නිසි කාර්යය පටිපාටිය අනුගමනය කරමින් පැරමෝ මායිම් නැවත සීමා නිර්ණය කිරීමට පරිසර අමත්‍යවරයාට නියෝග කරමින්, 2018 දී, අධිකරණය යෝජනා සම්මතය ප්‍රතික්ෂේප කළේය.

කෙසේවෙතත්, සාධාරණ කාල රාමුවක් තුළ නැවත සීමා නිර්ණය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ඇමතිවරයාට නොහැකි විය. තවද, පැරමෝහි නීතිමය සීමාවන් පිළිබඳ අවිනිශ්චිතතාව හේතුවෙන්, මින්ටෙක්ස් හට භාවිත කිරීමේ අදියර ආරම්භ කිරීමට අවශ්‍ය පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට නොහැකි විය. එසේම, දැනට පවතින පැරමෝ සිතියමට අනුව සහන ප්‍රදේශය (concession area) වීනස් පැරමෝ

පරිසර පද්ධතිය සමඟ සැලකිය යුතු ලෙස අතිච්ඡාදනය වන නිසා සමාගමට එහි පතල් කැණීම් සිදු කළ හැකිද යන්නත් අවිනිශ්චිත විය. අවසානයේදී, බොලෝනියාවේ වසර ගණනාවක් ගත කිරීමෙන් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක් ඉක්මවූ ආයෝජනයකින් ලීමා ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමෙන් අනතුරුව, මින්ටෙක්ස් සහන ගිවිසුම අත්හැර දමා, 1987 දී බොලෝනියා (Bolonia) සහ සෙලොනියා (Selonia) අතර බලාත්මක වූ ද්විපාර්ශ්වික ආයෝජන සම්මුතිය (BIT) යටතේ ආයෝජන ආරවුල් නිරාකරණය කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (ICSID) බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කළේය. මෙම ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම සියලුම මූලික ආයෝජන ආරක්ෂණයන් සහ සම්මුති පදනම් වූ ආයෝජන බේරුම්කරණය සඳහා ප්‍රවේශය සපයයි.

1. බොලෝනියානු රජයේ නීති උපදේශක ලෙස, බෝලෝනියාවට බේරුම්කරණ පර්ෂදයේ අධිකරණ පාත්‍රතාව (jurisdiction) ICSID සම්මුතියේ 25 වැනි වගන්තිය යටතේ අභියෝග කළ හැකි හේතු සාකච්ඡා කරමින් නීතිමය මතයක් සකස් කරන්න.

2. මින්ටෙක්ස් වෙනුවෙන් ICSID බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ පෙනී සිටීමට ඔබව නිරත කරගෙන ඇත. 1987 Bolonia-Selonia BIT මත පදනම්ව සත්කාරක රාජ්‍යයට එරෙහිව පවතින  ප්‍රබලම චෝදනාව/ චෝදනාවන්  සම්බන්ධයෙන් නීතිමය මතයක් සකස් කරන්න.

3. ඔබ පැරමෝ සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානයක නීති පර්යේෂණ ඒකකයේ ප්‍රධානියා වන අතර මෙම බේරුම්කරණ ක්‍රියාවලියට amicus curiae ලෙස සහභාගී වීමට කැමති යැයි උපකල්පනය කරන්න. මහජන යහපත සඳහා නියාමනය කිරීමට රාජ්‍යය සතු අයිතිය සහතික කරමින්, සත්කාරක රාජ්‍යයන් ආයෝජන නොවන අරමුණු සාක්ෂාත් කර ගැනීම බල ගන්වන නීතිමය හේතු සහ ප්‍රතිපත්තිමය කරුණු විස්තර කරන නීතිමය සංදේශයක් සකස් කරන්න.

**ආ කොටස**

---

4. නගර් යනු විදේශ ප්‍රාග්ධනය ගලා ඒමේ වැදගත්කම අවධාරණය කරන වේගයෙන් වර්ධනය වන සංවර්ධනය වෙමින් පවත්නා රටකි. විදේශ ආයෝජන ප්‍රවේශ කරගන්නා අවස්ථාවේදී එකඟ වූ නියම සහ කොන්දේසි වලට අනුකූල නොවන ආයෝජන ව්‍යාපෘති කිහිපයක් අවලංගු කිරීමට පියවර ගැනීම සඳහා රජය මෑතකදී ආර්ථික සංවර්ධනය පිළිබඳ කමිටුවක් පත් කළේය. නගර් රජය, දැනට පවතින ඇඟලුම් කම්හලක් නවීන උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර සමඟ වඩාත් ජනාකීර්ණ ප්‍රදේශයක නැවත ඉදිකිරීමට කිරීමට ABC Ltd හි යෝජනා ක්‍රමයක් අනුමත කරයි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ද ව්‍යාපෘතියට ඇතුළත් වේ. ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා, එකඟ වූ ප්‍රාග්ධන ප්‍රමාණයක් ගෙන ඒමට සහ එම අවශ්‍ය ප්‍රාග්ධනය රට තුළට රැගෙන ඒම සහතික කිරීම සඳහා නගර් බැංකුවේ සහතිකය ලබා ගැනීමට සමාගම එකඟ වේ. කෙසේවෙතත්, සමාගම ප්‍රාග්ධන අවශ්‍යතාවට අනුගතව නොමැති බවත්, එය කසළ

කළමනාකරණ පද්ධතියට බලපාන බවත්, ප්‍රදේශයේ මහජන පීඩනයක් අපේක්ෂා කළ හැකි බවත් කමිටුව සොයා ගනියි. එපමණක් නොව එම අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමය අකාර්යක්ෂම නම්, එම ව්‍යාපෘතියෙන් රටට අපේක්ෂිත ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ නොලැබෙන අතර ඒ වෙනුවට අධික රසායනික ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පාරිසරික ව්‍යසනයක් නිර්මාණය වනු ඇත. කමිටුවේ උපදෙස් මත ව්‍යාපෘතිය අවසන් කිරීමටත්, රජයේ අනුග්‍රාහකත්වය සහිත රජය සතු සංස්ථාවකට එය පැවරීමටත් රජයේ බලධාරීන් දැන් සූදානම්ව සිටිති. නගර් නිසි කාර්යය පටිපාටිය (due process) අනුගමනය කිරීමට අපොහොසත් බව සහ වෙනස් කොට සැලකීම පිළිබඳ අන්තර්ජාතික රීති උල්ලංඝනය කරන බවට චෝදනා කරමින් ABC Ltd, රජයට එරෙහිව බේරුම්කරණ ක්‍රියාදාමයන් ආරම්භ කරයි.

ඉහත තත්ත්වයන් තුළින් පැන නැගෙන නීතිමය ගැටළු විශ්ලේෂණය කරන්න.

5. "මව් රාජ්‍යයට ජාතිකත්වය පදනම් කරගෙන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම හරහා විදේශීය ආයෝජකයින් ලෙස විදේශයන්හි ක්‍රියාත්මක වන සිය ජාතිකයන් අන්තර්ජාතික සම්මතයන්ට (international norms) අනුකූලව ක්‍රියා කරන බව සහතික කිරීමට හැකියාව ඇත."

පිටතට රැගෙන යන (outbound) විදේශ ආයෝජන ආශ්‍රිත යුතුකම් සහ වගකීම් සම්බන්ධයෙන් මව් රාජ්‍යය සතු පියවරයන් (home state measures) ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

6. සීලන්ඩ් රාජ්‍යය, කලාපයේ ස්වභාවික, මානව සම්පත් සහ ඉහළ සාක්ෂරතා අනුපාතයන්ගෙන් පොහොසත් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයකි. කෙසේවෙතත්, සමාන අසල්වැසි රටවල් හා සසඳන කළ ඊට සෘජු විදේශ ආයෝජන ගලා ඒම සාපේක්ෂව අඩුය. ධනවත් රටවල් වෙතින් සෘජු විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා සීලන්ඩ් රජය මෑතකදී නවීන නගරයක් (modern city) ස්ථාපිත කළේය. විදේශ ආයෝජනයන්හි ප්‍රතිලාභ පිළිබඳව රජය වඩාත් සැලකිලිමත් වන බව විදේශ ආයෝජන පිළිබඳ නව ප්‍රතිපත්තියෙන් හෙළිදරවේ. වඩා තිරසාර ආර්ථික ප්‍රතිලාභ ලබා ගනු පිණිස විදේශ සෘජු ආයෝජන ගලා ඒම වැඩි කිරීම සඳහා ආයෝජකයින්වෙත වඩා යහපත් වූ හිතකර පරිසරයක් ලබා දීමට එහි විදේශ ආයෝජන නීති සංශෝධනය කිරීමට රජය දැන් අපේක්ෂා කරයි.

සීලන්ඩ්හි විදේශ ආයෝජන නීති සහ ඒවායේ බලපෑම අධ්‍යයනය කිරීමට පර්යේෂකයෙකු ලෙස ඔබව පත් කර ඇතැයි උපකල්පනය කරන්න. සීලන්ඩ් සඳහා සුදුසුම ආකෘතියක් යෝජනා කිරීමට ඔබේ කෙටුම්පතේ ඔබ සලකා බලන විශේෂාංග ලැයිස්තුගත කරන්න.